**පාතදුම්බර ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**---------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.**

**1.2 මතය.**
**-----------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

**පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සභාව සතු රු.10,368,381 ක් වටිනා ඉඩම් කැබලි 26 ක් තක්සේරු කර නොතිබුණු ඉඩම් කැබලි 67 ක් හා නළ ළිං 77 ක අගයන් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.**

**(ආ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු ගැල්වනයිස් බට (GI) 528 ක වටිනාකම වූ රැ 584,573 ක් ගිණුම්ගත කර නොතිබුණි.**

**1.3.2 නොසැසදු පාලන ගිණුම්**
**---------------------------**

**ගිණුම් විෂයයන් 02 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.492,866 ක් වූ අතර, උපලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.480,650 ක් වූයෙන්, රු.12,216 ක නොසැසඳීමක් නිරික්ෂණය වී තිබුණි.**

**1.3.3 ලැබියයුතු ගිණුම්**
**-------------------**

**2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.79,597,306 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලය ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.4,361,326 ක් විය.**

**1.3.4 ගෙවියයුතු ගිණුම්.**
**-------------------**

**2014 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 09 ක එකතුව රු.74,961,683 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.3,502,800 ක් වී තිබුණි.**

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**------------------------------------**

**ගිණුම් විෂයයන් 03 කට අදාල අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතු වටිනාකම රු.4,799,440 ක් වු ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**2. මුල්‍ය සමාලෝචනය**

**-------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

**ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,675,194 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,881,271 ක් වූයෙන් මුල්‍ය ප්‍රතිඵල වල රු.4,793,923 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 ආදායම් පරිපාලනය**

**----------------------**

**2.2.1 වරිපනම් බදු**

**---------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට හිඟ බදු රු.1,688,226 ක් වු අතර වර්ෂයේ බිල් කිරීම් රු.5,420,626 ක් වී තිබුණි. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය හිඟයෙන් සියයට 61 ක් හා බිල් කිරීම්වලින් සියයට 68 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,412,398 ක් විය. හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159(1) වගන්තිවල විධිවිධාන අනුගමනය කර, අය කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ) රජයේ ආයතන 10 කින් වර්ෂ 01 ත් 13 ත් අතර කාලයක සිට පවතින හිඟ වරිපනම් බදු රු.43,859 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**2.2.2 කඩ කුළී.**

**------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුළී රු.389,847 ක් වු අතර, එම ශේෂයෙන් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු මුදල රු.384,037 ක් වී තිබුණි.**

**(ආ) සභාව සතු කඩ කාමර 09 කින් 2000 සිට 2011 කාල පරිච්ඡේදයට අදාළ රු.331,158 ක කඩ කාමර කුළී අය කර ගෙන නොතිබුණු අතර, ඒ සම්බන්ධව බදු ගිවිසුම් ප්‍රකාරව අය කිරීමට කටයුතු කර නොතිබුණි.**

**2.2.3 ජල ගාස්තු**

**----------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තුව රු.235,743 ක් වු අතර, එම ශේෂයෙන් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු හිඟ මුදල රු.146,075 ක් වී තිබුණි.**

(ආ) දැනට ක්‍රියාත්මක නොවන මීගම්මන යටවර ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින් **60** කගේ රු.**29,890** ක හිග ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් **2014** දෙසැම්බර් **31** දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.**22,576,198** ක් ලැබිය යුතුව තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

**3.1** ගැල්වනයිස් බට ලැබීම්

--------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ (සංවර්ධන) **2014** දෙසැම්බර් **19** දිනැති අංක පීඑල්/**3/1/9** දරන ලිපියෙන් රු.**584,573** ක් වටිනා ගැල්වනයිස් බට **528** ක් නඩත්තු අංගනයේ ප්‍රයෝජනය සදහා ලබා දී තිබුණි. පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(i) රු.**7,750** ක් වටිනා ගැල්වනයිස් බට **07** ක් සභිකයකු විසින් පෞද්ගලික පරිහරණය සදහා රැගෙන ගොස් තිබු නමුත්, විගණන දින වූ **2015** ජූලි **21** දින දක්වා එය ආපසු සභාවට භාරදී නොතිබුණි.

(ii) රු.**107,393** ක් වටිනා බට **97** ක් යොදා සභාවේ අභ්‍යන්තර රාක්කයක් ඉදි කර තිබුණි. මෙම ඉදි කිරීමට අදාළ ඇස්තමේන්තු, සැළසුම් හා ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු සාර්ථකව නිම කර ඇති බවට කාර්මික නිලධාරී වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

(iii) රු.**178,251** ක් වටිනා බට **161** ක් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධව කිසිදු ආකාරයේ ඉදිරි සැළසුමක් නොමැතිවීම හේතුවෙන්, නිෂ්ක්‍රීයව ගබඩා තුළ තබා තිබුණි.

(iv) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ ලිපියට අනුව, ප්‍රාදේශීය සභාව සැළසුම් කර ඇති නඩත්තු අංගනයක් සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

ගිණුම්වල ඇතුළත් කර තිබු රු.**8,390,000** ක් වටිනා වාහන **02** ක අයිතිය පවරා ගෙන නොතිබුණි.

**3.3** සේවක ණය

-----------------

(අ) **2004** වර්ෂයේ විශ්‍රාම ගොස් ඇති නිලධාරියෙකුගෙන් අය වියයුතු රු.**33,886** ක ණය මුදලක් **2015** ජූලි **21** විගණන දින දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගොස් තිබූ නිලධාරීන් 09 දෙනෙකුගෙන් අය වියයුතු රු.476,323 ක් එක වර අය ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.62,090 ක්වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 02 ක් හා වටිනාකම හඳුනා ගෙන නොතිබූ කැබ් රථයක් වසර 04 සිට වසර 07 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පවත්නා අතර, එම වත්කම් යථා තත්ත්වයට පත් කර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.28,960 ක් වූ ද්‍රව්‍ය ඒකක 06 ක් හා වටිනාකම දක්වා නැති ඒකක 03 ක් වසර 02 ට අධික කාලයක සිට නිකුත් නොකර, ගබඩාවේ නිෂ්ක්‍රීයව තබා තිබුණි.

3.5 කොන්ත්‍රාත් පාලනය

---

(අ) රු.13,189,310 ක් වටිනා කොන්ත්‍රාත් වැඩ 102 ක් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 177 හා 178 වගන්ති වල විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව ප්‍රජා පාදක සංවිධානවලට පවරා තිබුණි

(ආ) පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක2012 වර්ෂයේ දී, ප්‍රාදේශීය සභාව සඳහා රු.23,338,038 ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදි කර ඇතත්, එම ගොඩනැගිල්ල පිහිටි හෙක්. 0.1028 ක ඉඩම් කොටස 2015 ජූලි 20 දින වන විටත් ප්‍රාදේශීය ලේකම් වෙතින් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසැඳීමේ දී ආදායම් විෂයයන් 07 ක සියයට 11 සිට සියයට 171 ක් දක්වා ද, වියදම් විෂයයන් 04 ක සියයට 17 සිට සියයට 170 ක් දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අයවැය පාලනය.

(ඇ) ආදායම් පරිපාලනය.

(ඈ) වත්කම් කළමනාකරණය.

(ඉ) කොන්ත්‍රාත් පාලනය